විෂය Subject - දේශීය නර්තනය Oriental Dance

ශ්‍රේණිය Grade - 8

කාලච්ඡේද Periods - 60

| | නිපුණතාව | ක්‍රියාකාරකම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 7 ශ්‍රේණියෙන් 11 වාරය | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.3 කුළු/ තාලම් නමාණයට එක්වෙමු.** | • කුළු/ තාලම් නැටුමෙහි ලක්ෂණ විස්තර කරයි.<br>• කුළු/ තාලම් නැටුමට උචිත සරල පද(මාත්‍රා) නිර්මාණය කරයි.<br>• රංග උපකරණ නිසි ලෙස හසුරවමින් නර්තනය කරයි.<br>• කණ්ඩායම් හැඟීමෙන් යුතුව සාමූහිකව නර්තනයේ යෙදෙයි.<br>• නිමාවක් ඇති කුළු/ තාලම් නැටුමක් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරයි. | • කුළු/ තාලම් නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ<br>• කුළු/ තාලම් නැටුම නිර්මාණය | 02 |
| | 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගයන කුසලතා ප්‍රදර්ශනය කරයි. | **4.2 ජන ගායන ඉදිරිපත් කිරීම.** | • එක් එක් ගයනාවල අනන්‍යතා ලක්ෂණ විස්තර කරයි.<br>• නිවැරදි නාද රටා අනුගමනය කරමින් වන්නම් හා කවි ගායනය කරයි.<br>• ගායනය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමේ දී සරල චලන භාවිතයට ගනියි.<br>• සාමූහිකව හා ඒකලව ස්වකීය හඬ පාලනය කරමින් ගායනය කරයි. | • කුළු, තාලම්, මල් යහන්, තලමල වරුණ කවි ගායනාවල සංස්කෘතික පසුබිම<br>• කුළු, තාලම්, මල් යහන්, තලමල වරුණ කවි ගායනය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.1**<br>**දවුල පිළිබඳ තොරතුරු විමසමු.** | • දවුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• එය භාවිත වන අවස්ථා නම් කරයි.<br>• එහි පරිමිතිය හා සැකස්ම පිළිබඳ අදහස් දක්වයි.<br>• දවුල සැකසීමට ගන්නා අමුද්‍රව්‍ය නම් කරයි. | • සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු (දවුල) | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.5.2**<br>**වන්නම් ගයමින් නටමු.** | • බෙර වාදනයට අනුව නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් අදාළ වන්නමේ කවි ගායනය කරයි.<br>• නියමිත තාල රූපයට අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කරයි.<br>• තුරඟා වන්නම/ භාවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම තාල තබා කියයි.<br>• තුරඟා වන්නම/ භාවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.<br>• සාමූහිකව හා ඒකලව අභ්‍යාසයේ යෙදෙමින් කුසලතා වර්ධනය කරගනියි. | • සුළු මැදුම් දෙතිතට අයත් තුරඟා වන්නම/ භාවාදි තාලය සින්දු වන්නම/ කුදිරඩි වන්නම සම්පූර්ණයෙන් නැටීම. | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය | **5.1**<br>**ශිල්පීය ප්‍රාගුණ්‍ය එළි දක්වන අවස්ථා ඉදිරිපත් කරමු.පිය ප්‍රාගුණ්‍ය** | • ඉගෙනුම ලබන නර්තන සම්ප්‍රදාය හා සබැඳි චාරිත්‍ර විධි හා වත් පිළිවෙත් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>• ඒ හා සබැඳි සාරධර්මවල වැදගත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • කළඑළි මංගල්‍යය/ හිස වෙස් පැළඳීම/ මඩු බැසීම/ ගුරු වරම් දීමට අදාළ චාරිත්‍ර විධි | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | | | | |
| | 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.4 පෙරහර තේමා කර ගනිමින් සමූහ වාදනයක් නිර්මාණය කරමු.** | • විවිධ ආගමික පෙරහර නම් කරයි.<br>• පෙරහැරෙහි දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩ නම් කරයි.<br>• එහි දී අසන්නට ලැබෙන ශබ්ද හා නාද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පෙරහර තේමා කරගනිමින් සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් සමූහ වාදන අංගයක් නිර්මාණය කරයි.<br>• නිර්මාණය කරන ලද වාදන අංගය පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි. | • තේමාව - පෙරහර | 02 |
| 7 ශ්‍රේණියෙන් 111 වාරය | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.2 උත්සාහය නමැති ස්ථායිභාවය ප්‍රදර්ශනය කරමු.** | • "උත්සාහ" නමැති ස්ථායි භාව ප්‍රදර්ශනය කිරීමට සුදුසු සිද්ධියක් ගොඩ නගයි.<br>• සිද්ධියට අදාළ චරිතවල ස්වභාවය ප්‍රදර්ශනය කරයි.<br>• "උත්සාහ" නමැති භාවය ප්‍රදර්ශනය වන පරිදි කණ්ඩායම් හැඟීමෙන් යුතුව චරිත නිරූපණය කරයි.<br>• නිර්මාණ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වමින් තම නිර්මාණ පිළිබඳව අන්‍ය අදහස් විමසයි. | • භාව ප්‍රකාශනය - උත්සාහ<br>• සිද්ධික් ඇසුරෙන් | 02 |

| | නිපුණතාව | ක්‍රියාකාරකම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.2 **ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මය හඳුනා ගනිමු.** | • ශාන්තිකර්ම යනු කුමක් දැයි හඳුන්වයි.<br>• ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>• ශාන්තිකර්ම පැවැත්වීමට හේතු වූ කරුණු විස්තර කරයි.<br>• පුරාවෘත්ත කතාව විස්තර කරයි.<br>• පුද ලබන දෙවිවරුන් නම් කරයි.<br>• ශාන්තිකර්මය හා සබැඳි නර්තන, ගායන, වාදන, චාරිත්‍ර විධි සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හා සබැඳි ප්‍රධාන ශාන්තිකර්මයට අදාළ තොරතුරු | 03 |
| | 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3 **නර්තන ශිල්පීන් අගයමු.** | • උඩරට, පහතරට, සබරගමු නර්තන ශිල්පීන් සාම්ප්‍රදායික නර්තන ප්‍රවර්ධනයට සිදුවූ සේවාව සාකච්ඡා කරයි.<br>• නර්තන ප්‍රවර්ධනය සඳහා සිදුකළ නිර්මාණ කෘති විස්තර කරයි. | • ජේ.ඊ. සේදරමන් ගුරුතුමා<br>• පොල්වත්තේ ගෝමිස් ගුරුතුමා<br>• රද්දැල්ලේ පොඩි මහත්මයා ගුරුතුමා | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.3**<br>**කරගම්/ කාවඩි නැටුම් ඉදිරිපත් කරමු.** | • කරගම්/ කාවඩි නර්තන අංගයට අවශ්‍ය රංග උපකරණය සකස් කර ගනියි.<br>• අදාළ නර්තන අංගයන්හි ගායන, වාදන ශ්‍රවණය කරයි.<br>• ගායනයට, වාදනයට අනුව නර්තන නිර්මාණය කරයි.<br>• වෙනත් සංස්කෘතීන්ට අයත් නර්තන අංගවල අදාළ ගති ලක්ෂණ භාවිතයට ගනියි.<br>• නර්තන අංග සාමූහිකත්වයෙන් යුතුව ඉදිරිපත් කරයි. | • කරගම්/ කාවඩි නර්තන නිර්මාණය | 02 |
| | 7.0<br>විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.2<br>**ගීතයට අනුව නර්තන නිර්මාණය කරමු.** | • අදාළ ගීතයට අනුව කණ්ඩායම් හා ඒකල වශයෙන් නර්තන නිර්මාණය කරයි.<br>• අවකාශ භාවිත කරමින් රංග රටා නිර්මාණය කරයි.<br>• සාමූහිකත්වයෙන් යුතුව ගීතයට අනුව නර්තන නිර්මාණ කරයි. | • අදවෙස්සන්තර රාජ පුතා<br>• වෙසක් කැකුළු අතු අග ඉද ගීතය | 02 |
| 7 ශ්‍රේණිය 11 හා 111 දක්වා වාර | | | | | 24 |

| | නිපුණතාව | ක්‍රියාකාරකම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 8 ශ්‍රේණියෙන් 1 වාරය | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.1.1 නර්තන මාධ්‍යයෙන් සත්ත්ව චරිත නිරූපණය කරමු.** | • සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණ නම් කරයි.<br>• සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණ පිළිබඳව විවිධත්වය ප්‍රකාශ කරයි.<br>• සත්ත්වයන්ගේ චර්යා ලක්ෂණ ඇසුරෙන් චලන නිර්මාණය කරයි.<br>• තාල, රිද්ම අනුගමනය කරමින් නර්තන නිර්මාණය කරයි. | • විවිධ සතුන්ගේ චර්යා ලක්ෂණ හඳුනා ගැනීම. අලියා, සිංහයා, අශ්වයා, මොණරා, කුකුළා, උකුස්සා<br>• ඉගෙන ගන්නා සතුන්ගේ විවිධ ඉරියව් ඇසුරින් චලන නිර්මාණය<br>• එම චලන ඇසුරෙන් චලන නිර්මාණ | 03 |
| | 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.2 නර්තනයට පාද හුරුකර ගනිමු.** | • පා සරඹ/මණ්ඩි පද තාල තබා කියමින් මණ්ඩියෙහි නිවැරදි ඉරියව් හා අංගහාර අනුගමනය කර හමාර පද සමග ඉදිරිපත් කරයි.<br>• විලම්භ හා මධ්‍ය ලය පිළිබඳව අවබෝධයෙන් යුතුව පා සරඹ / මණ්ඩි පද ඉදිරිපත් කරයි.<br>• පා සරඹ/මණ්ඩි පදවල අභ්‍යාසයේ වැදගත්කම ප්‍රකාශ කරයි. | • පා සරඹ/මණ්ඩි පද 7 - 9 තෙක් හමාර පදය සමගින් | 02 |
| | 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා | **2.3 නර්තනයට හස්ත හා පාද හුරුකර ගනිමු.** | • ගොඩ සරඹ/ ඉලංගම් සරඹ/ දොඹින පද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• විධික්‍රම අනුගමනය කරමින් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි.<br>• ගොඩ සරඹ/ ඉලංගම් සරඹ/ දොඹින පද කස්තිරම්/ඉරට්ටි/හමාර පද විලම් මධ්‍ය ලයට බෙර වාදනය අනුව නර්තනය කරයි. | • ගොඩ සරඹ/ ඉලංගම් සරඹ/ දොඹින පද 5 - 6 තෙක් කස්තිරම/ඉරට්ටිය/ හමාර පදය සමඟින් විලම්බ, මධ්‍ය ලයට | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රදර්ශනය කරයි. | | • නිවැරදි අංගහාර පවත්වා ගැනීමට ගොඩ සරඹ / ඉලංගම් සරඹ/ දොඹින පද අභ්‍යාස ඉවහල් වන බව ප්‍රකාශ කරයි. | | |
| | 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගයන කුසලතා ප්‍රදර්ශනය කරයි. | **4.2 ජන කවි ගායනය කරමු. (සිරස පාද, සවරම්, පතුරු)** | • එක් එක් ගයනාවල අනන්‍යතා ලක්ෂණ විස්තර කරයි.<br>• නිවැරදි නාද රටා අනුගමනය කරමින් වන්නම් හා කවි ගායනය කරයි.<br>• ගායනය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමේ දී සරල චලන භාවිතයට ගනියි.<br>සාමූහිකව හා ඒකලව ස්වකීය හඬ පාලනය කරමින් ගායනය කරයි. | • සිරස පාද, සවරම්, පතුරු ගායනවල සංස්කෘතික පසුබිම<br>• නියමිත නාදමාලාවට අනුව කවි ගායනය<br>• නියමිත තිත් රූපයට අනුව ගායනය | 03 |
| | 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.4 බෙර හඬ මැද්දේ නටමු පද සිත්සේ** | • මැදුම් තනි තිතට අලංකාර මාත්‍රා නිර්මාණය කරයි.<br>• නිර්මාණය කරන ලද අලංකාර මාත්‍රා විවිධ නර්තන අංග සඳහා භාවිතයට ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• බෙර වාදනයට අනුව සාමූහිකව අලංකාර මාත්‍රා නර්තනය කරයි. | • උඩරට, පහතරට/ සබරගමු සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අගංකාර මාත්‍රා දෙකක් නිර්මාණය (මහ තනි තිතට) | 02 |
| 8 ශ්‍රේණියෙන් 11 වාරය | 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.3.2 පතුරු / සවරම් නැටුම නිර්මාණය කරමු.** | • සවරම් /පතුරු නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ නම් කරයි.<br>• උපකරණ නිවැරදි ව භාවිත කරයි.<br>• නර්තනයේ දී අවකාශය උචිත පරිදි භාවිත කරයි.<br>සාමූහිකව ඉදිරිපත් කරන ලද නර්තන අංග අගයමින් අදහස් ඉදිරිපත් කරයි | • සවරම් /පතුරු නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ<br>  • උපකරණ භාවිතයේ නිවැරදි විධික්‍රම<br>  • උචිත සරල පද<br>  • ගායනය සහිතව නර්තනය<br>• නර්තන නිර්මාණය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.1**<br>**පහතරට බෙරය පිළිබඳ තොරතුරු රැස් කරමු.** | • පහතරට බෙරය වාදනය කරන අවස්ථා නම් කරයි.<br>• යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරයි.<br>• ව්‍යුහය හා සැකැස්ම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• නියමිත පරිමාණයට අනුව රූප සටහනක් ඇඳ කොටස් නම් කරයි. | • පහතරට බෙරය හැඳින්වීම.<br>  • වාදන අවස්ථා<br>  • ව්‍යුහය<br>  • යොදා ලන්නා අමුද්‍රව්‍ය | 02 |
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.2**<br>**සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය කරමු.** | • සතර බීජාක්ෂර වාදනය කරන අයුරු විස්තර කරයි.<br>• සතර බීජාක්ෂර වාදනය කරයි.<br>• සුළු තනිතිතට අයත් බෙර පද නම් කරයි.<br>• සුළු තනිතිතට බෙර පද වාදනය කරයි.<br>• සාමූහිකව බෙර පද වාදනය කරයි. | • සතර බීජාක්ෂර<br>• සුළු තනි තිතට අනුව බෙර පද වාදනය (ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාළව) | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.5.2**<br>**වන්නම් ගයමින් නටමු** | • බෙර වාදනයට අනුව නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් අදාළ වන්නමේ කවි ගායනය කරයි.<br>• නියමිත තාල රූපයට අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කරයි.<br>• වෛරොඩි වන්නම/ ඊශ්වර කුණ්ඩ තාලය සින්දු වන්නම/ කදම්භ පක්ෂි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම තාල තබා කියයි.<br>• වෛරොඩි වන්නම/ ඊශ්වර කුණ්ඩ තාලය සින්දු වන්නම/ කදම්භ පක්ෂි<br>• වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.<br>• සාමූහිකව හා ඒකලව අභ්‍යාසයේ යෙදෙමින් කුසලතා වර්ධනය කරගනියි. | • වෛරොඩි වන්නම/ ඊශ්වර කුණ්ඩ තාලය සින්දු වන්නම/ කදම්භ පක්ෂි වන්නම සම්පූර්ණයෙන් | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.1**<br>**නර්තන කලාව හා බැඳි මූලාශ්‍රය හඳුනා ගනිමු.** | • රූකම් වර්ග කර දක්වයි.<br>• රූකම් දක්නට ලැබෙන ස්ථාන නම් කරයි.<br>• නර්තන පැවති බවට රූකම්, ඇසුරෙන් සාධක ඉදිරිපත් කරයි.<br>• සමාජීය හා ආගමික අවශ්‍යතා සඳහා නර්තනය භාවිතයට ගත් බවට තොරතුරු ඉදිරිපත් කරයි.<br>• රූකම් ආරක්ෂා කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි | • මූලාශ්‍රය - රූකම්<br>  • ගල් කැටයම්<br>  • ලී කැටයම්<br>  • සිතුවම්<br>  • මූර්ති | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.6.1**<br>**නිර්දේශිත කවි හා පද ප්‍රස්තාර කරමු.** | • සුළු මහ දෙතිතේ තාලයට බෙරපද/දවුල් පද ප්‍රස්තාර කරයි.<br>• මැදුම් තනිතිතේ තාලයට අදාළ වන්නම්වල බෙර පදය සිට කස්තිරම/ඉරට්ටිය/කලාසම තෙක්<br>• ප්‍රස්තාර කරයි.<br>• අදාළ කවි ප්‍රස්තාර කරයි. | • සුළු මහ දෙතිතේ තාලයට බෙර පද / දවුල් පද<br>• ඉගෙන ගන්නා ලද වන්නම්වල අදාළ කොටස් | 02 |
| 8 ශ්‍රේණිය 111 වාරය | 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.2**<br>**භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය** | • භය නමැති ස්ථායී භාවය ඉස්මතු වන අවස්ථා නම් කරයි.<br>• එහි සුවිශේෂ ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>• භාවයට අදාළ සිද්ධියක් ගොඩනගයි.<br>• භාවය ප්‍රකාශ වන පරිදි සිද්ධියක් අනුව චරිත නිරූපණය කරයි.<br>• ඉදිරිපත් කරන ලද චරිත නිරූපණ අගය කරමින් අදහස් දක්වයි | • භය නමැති ස්ථායි භාවය හා සබැඳි අවස්ථා<br>• භය නමැති ස්ථායි භාවයේ සුවිශේෂී ලක්ෂණ<br>• භය නමැති ස්ථායි භාවය ඉස්මතු වන පරිදි සිද්ධියක් ගොඩ නැගීම.<br>• සිද්ධියට අනුව චරිත නිරූපණය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.6.2**<br>**නිර්දේශිත කවි හා පද ප්‍රස්තාර කරමු.** | • සුළු මහ දෙතිතේ තාලයට බෙරපද/දවුල් පද ප්‍රස්තාර කරයි.<br>• මැදුම් තනිතිතේ තාලයට අදාළ වන්නම්වල බෙර පදය සිට කස්තිරම/ඉරට්ටිය/කලාසම තෙක්<br>• ප්‍රස්තාර කරයි.<br>• අදාළ කවි ප්‍රස්තාර කරයි. | • සිරස පාද, සවරම්, පතුරු කවි ප්‍රස්තාරකරණය | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.2**<br>**ශාන්තිකර්ම හඳුනාගනිමු.** | • අදාළ ශාන්තිකර්මය පැවැත්වීමට හේතු දක්වයි.<br>• පුරාවෘත්ත (කතාව) විස්තර කරයි.<br>• පුද ලබන දෙවිවරුන් /යකුන් නම් කරයි.<br>• අදාළ ශාන්තිකර්මයේ අන්තර්ගත ගායන, වාදන, නර්තන, රංග වස්ත්‍රාභරණ රංගභාණ්ඩ, චාරිත්‍රවිධි හා සැරසිලි නම් කරයි.<br>• ශාන්තිකර්ම පැවැත්වීමේ දී සාමූහික ව කටයුතු කිරීම පිළිබඳ ව අගයමින් අදහස් දක්වයි. | • ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හැර වෙනත් නර්තන සම්ප්‍රදායකට අයත් ශාන්තිකර්මයක තොරතුරු<br>**උඩරට - කොහොඹායක්කංකාරිය**<br>**පහතරට - දෙවොල් මඩුව**<br>**සබරගමු - පහන් මඩුව**<br>පුරාවෘත්ත කතාව, පැවැත්වීමට හේතු, පුද ලබන, දෙවිවරු සහ යකුන්, නර්තන, ගායන, වාදන, චාරිත්‍ර, රංගභාණ්ඩ, රංගවස්ත්‍රාභරණ | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය | **5.3**<br>**නර්තන ශිල්පීන් අගයමු** | • එස්. පණීභාරත ( උඩරට)<br>• කේ. එස්. ප්‍රනාන්දු (පහතරට)<br>• ගළුකාගම හීන් නිලමෙ (සබරගමු) යන ශිල්පීන්ගෙන් සාම්ප්‍රදායික නර්තන ප්‍රවර්ධනයට සිදුවූ සේවාව විස්තර කරයි.<br>• එම ශිල්පීන් විසින් දක්වන ලද කුසලතා අගයමින් අදහස් දක්වයි. | • එස්. පණීභාරත ( උඩරට)<br>• කේ. එස්. ප්‍රනාන්දු (පහතරට)<br>• ගළුකාගම හීන් නිලමෙ (සබරගමු) යන ශිල්පීන් නර්තන ප්‍රවර්ධනයට දැක්වූ දායකත්වය. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | | | | |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.2**<br>**භරත නාට්‍ය සම්ප්‍රදාය හඳුනා ගනිමු** | • ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>• ආගමික පසුබිම විස්තර කරයි.<br>• සංගීත සම්ප්‍රදායය හා වාද්‍ය භාණ්ඩ නම් කරයි.<br>• නර්තනය උගන්වන ආයතන නම් කරයි.<br>• නර්තන අංග සහ රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව අදහස් දක්වයි. | • භරත නාට්‍යම් සම්ප්‍රදාය<br>• ප්‍රචලිත ප්‍රදේශ<br>• ආගමික පසුබිම හා විකාශනය<br>• සංගීත සම්ප්‍රදාය<br>• වාද්‍ය භාණ්ඩ<br>• නර්තන අංග සහ<br>• රංගවස්ත්‍රාභරණ | 02 |
| | 7.0<br>විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | **7.2**<br>**ගීතයට අනුව නර්තන නිර්මාණය කරමු.** | • ගීතයට උචිත චලන යොදා ගනිමින් නර්තන නිර්මාණ කරයි.<br>• ඒකල හා සාමූහික වශයෙන් නර්තන නිර්මාණ කරයි.අවකාශය<br>• ලෙස යොදා ගනිමින් නිමාවක් සහිත නර්තන ඉදිරිපත් කරයි.<br>• ඉදිරිපත් කරන ලද නර්තන අංග පිළිබඳ ව අගයමින් අදහස් ප්‍රකාශ කරයි | • දීකිරි දීකිරි / රත්නදීප ජන්ම භූමි<br>• පද රචනය හා භාෂාව<br>• සංගීතය<br>• ගායනය<br>• ගීතයේ අර්ථය | 02 |
| | | | | | 36 |